*ප්‍රශ්නය : ස්වාමින් වහන්ස ඔබ වහන්සේගේ විශේෂ සමාජ දර්ශනයක් තියෙනවා. ඒ ගැන දර්ශනය පිළිබඳ පැහැදිලි කරන්න පුළුවන් ද ස්වාමීන් වහන්ස?*

පිළිතුර : මම විශ්වාස කරන ආකාරයට රටක්, සමාජයක් හදන්න ප්‍රථමයෙන් ඒ රටේ, සමාජයේ සිටින පිරිස හැදීම අවශ්‍යයි. විශේෂයෙන් ළමා හා තරුණ පිරිස් යහමගට ගෙන ඒ අයගේ වටිනාකම, යුතු අයුතු කම් හා වගකීම් පිළිබඳව හොඳ අවබෝධයක්, දැනීමක් ලබා දුනහොත් පමණයි ඒ අයගේ ඉදිරි ජීවිත සාර්ථක වෙන්නේ. අපේ රටේ අද සමාජය තුළ තරුණ පිරිස් විශාල වශයෙන් නොමගට යොමු වෙමින් සිටිනවා. එය අප සියලු දෙනාම  පිළිගන්න දෙයක්. පැවිදි හෝ ගිහි හෝ වේවා තරුණ ළමයි වැරදි මාර්ග වලට, වැරදි අදහස් වලට ඊර්ෂ්‍යාව, වෛරය හා ක්‍රෝධය මුල් කර ගත් වැරදි දේවල් සඳහා තවත් සුළු පිරිසක් විසින් යොමු කරමින් සිටිනවා.

මේ පිරිස ඒ තත්වයෙන් ගොඩ ගත්තේ නැතිනම් මේ රට කවදාවත් හදන්න බැරි බව මම දැඩි ලෙස විශ්වාස කරනවා. අතිපූජ්‍ය මඩිහේ නායක හාමුදුරුවන් ප්‍රකාශ කළා වගේ මිනිසා හදා, රට හදන්න උවමනායි. මිනිසා හදන්නේ නැතිව රටේ ගොඩනැගිලි, මහා මාර්ග ආදි මොන දේ හැදුවත් වැඩක් වෙන්නේ නැහැ. නොමග ගිය මිනිසා, ඒ මානසිකත්වය පාවිච්චි කර ඉතාමත් වේගයෙන් කලාන්තරයක් තිස්සේ හදපු ඒ ගොඩනැගිලි විනාශ කරලා දමන්න පුළුවන්. තිරිසන් සතුන්ගෙන් මෙය වෙන්නේ නැහැ. මේ සියල්ල සිදුවන්නේ හිතන්න පුළුවන් මනුෂ්‍යයාගෙන්. අද ලෝකයේ සිදු වෙලා තියෙන්න ඒ දෙයයි. අපේ මේ තරුණ පිරිසට මනුෂ්‍ය කමේ ඇති වටිනාකම, සාරධර්ම ගුණධර්ම වල වටිනාකම,  බුද්ධ ධර්මයේ වටිනාකම කියා දී ඒ මනුෂ්‍ය කමින් තමන්ටත්, තමන්ගේ දෙමාපියන්ටත්, තමන්ගේ වැඩිහිටි නැදෑයන්ටත්, තමන්ගේ රටටත්, ආගමටත් ප්‍රයෝජනවත් පිරිසක් බවට පත් කරලීමේ වැඩ පිළිවෙලක් මම ක්‍රියාත්මක කරනවා. ශාසනය, රට ආරක්ෂා කරන්න, දියුණු කරන්න පුළුවන් වන්නේ ඒ තුළින් බව මම විශ්වාස කරනවා.

*ප්‍රශ්නය : ඔබ වහන්සේට බොහෝ ජාත්‍යන්තර අත්දැකීම් තිබෙනවා. මේ දර්ශනයට ඒ තුළින් ලබාගත හැකි දේ මොනවාද?*

පිළිතුර : ලෝකයේ ඇතැම් බෞද්ධ රටවල් වල තාවකාලික පැවිද්ද කියල එකක් තියෙනවා. සති දෙකට, මාස තුනට, අවුරුද්දකට ආදි වශයෙන් ඒ අය පැවිදි වෙලා බොහෝ විනීත ජීවිත ගත කරනවා. සමහර විට රැකියාවක් ලබා ගැනීමට, විවාහයක් කර ගැනීමට එම පැවිද්ද විශේෂ සුදුසුකමක් වෙනවා. මැලේසියාවේත් තරුණ පිරිස් වාර්ෂිකව විශාල වශයෙන් ඒ සති දෙකේ පැවිදි දහම් පුහුණු පිංකමට සහභාගි වෙනවා. ඒ පුහුණු වීමෙන් පස්සේ ඔවුන්ගේ තිබුණ වෙනස්වීම් මම දැක්කා. කවදාවත් දෙමාපියන්ට ගරු

කළේ නැති ළමයි ගරු කරන්න පටන් ගත්තා. විවාහ වූ අයගේ අඹුසැමියන් අතර තිබූ බැඳීම් වැඩි දියුණු වුණා. මත්පැන් පානය, දුම්වැටි භාවිතය වැනි ඒ අය තුළ තිබූ යම් යම් වැරදි පුරුදු නතර කළා. මේ නිසා ආර්ථිකය යහපත් වුණා. ලංකාවට පැමිණ මම කල්පනා කළා මේ ක්‍රමය අපේ රටටත් හදුන්වා දෙන්න අවශ්‍යයි කියලා.

දැන් අවුරුදු තුනක පමණ සිට හොරණ දෙකඳුවල භාවනා මධ්‍යස්ථානය මුල් කර ගෙන මාසිකව එක මාසයකට තරුණයෝ විස්සක්, විසිපහක් පමණ සම්බන්ධ කරගෙන ඒ අයව උදේ හයේ සිට රාත්‍රි දහය දක්වා හොඳ දින චර්යාවක් හදා දස සීලයක පිහිටුවා බුදුන් වදින්න, භාවනා කරන්න, වතාවත් කරන්න කිය දෙනවා. එයට අමතරව මනුෂ්‍යකමේ වටිනාකම, ධර්මයේ ඇති වැදගත් කම, ඒවා ආරක්‍ෂා කරන පිළිවෙල, අපේ බුද්ධ ධර්මය, භාවනාව, අපේ දෙමාපියන්, වැඩිහිටියන් පිළිබඳව, තමන්ගේ ජීවිතය පිළිබඳව හොඳ අවබෝධයක් බොහෝම ආදරයෙන් කරුණාවෙන් මේ ළමයින්ට ලබා දෙනවා. සති දෙකකට පසු මේ අයගේ ජිවිත සම්පූර්ණයෙන් වෙනස්. හිතේ තිබුණ යම් යම් දේවල් පිළිබඳ වෛරය, ඊර්ෂ්‍යාව ආදිය නැති වී ඒ වෙනුවට ඔවුන්ගේ මනස තුළ කරුණාව, මෛත්‍රිය, දයාව, අනුකම්පාව වැනි යහපත් ගුණධර්ම මේ මනසට ඇතුල් කරන්න අපට හැකියාව ලැබුනා. මෙයයි මුළු සමාජය තුළම සිදුවිය යුත්තෙ.

***ප්‍රශ්නය : තායිලන්තය වගේ රටවල බොහෝ දෙනෙක් මේ ආකාරයේ වැඩසටහන් සඳහා සහභාගි වෙනවා. ඔබ වහන්සේ මෙය මේ අදහස අපේ රටේ ක්‍රියාත්මක කරන තුරු මෙය අලුත් දෙයක් ලෙස තමයි තිබුණේ?***

පිළිතුර : තායිලන්තය වගේම කාම්බෝජය, ලාඕසය වගේ රටවලත් මෙම වැඩපිළිවෙල අවුරුදු සිය ගණනක සිට පැවතුණා. ථෙරවාදී බුදුදහම කලක් අපේ රටින් තුරන් වී ගියා. පසුව මීට අවුරුදු 250 කට පමණ පෙර අසරණ සරණ සරණංකර හාමුදුරුවන් නැවත රටට උපසම්පදාව ගෙනවා. ඊට පසුව අපේ රටේ අවුරුදු 12-14 වයසේ ළමයි පැවිදි කළා. ඒ ළමයි ශාසනයට පූජා කළ දෙමාපියන් විශ්වාස කළා වගේම අපේ හාමුදුරුවරුත් ඔවුන් තළ විශ්වාසයක් ඇති කළා මහන වුවහොත් මුළු ජීවිත කාලය පුරාම ඒ පැවිදි කමේ ම ඉන්න අවශ්‍ය බව. සිවුරු හැර යන එක ඔහුටත්, දෙමාපියන්ටත්, ගුරුවරුන්ටත් ආදී වශයෙන් වූ සියලු දෙනාටම හොඳ නැහැ යන ආකල්පය අපේ රටේ ගිහි සමාජය තුළ ඇති වුණා. මෑතක් වන තුරුම සිවුරු හැර ගියේ බොහෝම රහසිගතව. 'හීරලුවා' කියන වචනයෙන් අදහස් කරන්නෙත් 'සිවුරු හැර ලු' කියන එකයි. ඒ හේතුවෙන් අන් රට වල වගේ අපේ රටේ තාවකාලික පැවිද්ද ඇති වුයේ නැහැ.

***ප්‍රශ්නය : ස්වාමින්වහන්ස, අනාගතයේ දී තරුණන් අතර විනය ඇති කරන මේ වැඩපිළිවෙල සඳහා සහාය ලබා දෙන්න රජයකට හැකියාව තිබෙයිද?***

පිළිතුර ඃ අනිවාර්යයෙන්ම රජයක් විසින් මෙය කළ යුතුයි. රජයක් විසින් කළ යුත්තේ ඒ රටේ මිනිස්සු, රටේ දරුවෝ හදන එක. යම් යම් පිරිස් පැමිණ දරුවන්ගේ මනස විකෘති කරන තුරු, නොමගට යොමු කරන තුරු රජය විසින් ඇහැ කණ පියාගෙන සිටිනවා නම්, ඔවුන්ගේ වටිනා ජිවිත විනාශ වෙනතුරු බලා සිටිනවානම් එය මහා අපරාධයක් ලෙස හඳුන්වන්න පුළුවන්. රට හදන්න නම් මුලින්ම මිනිස්සු හදන්න අවශ්‍යයි. එය පසුගිය දසක කිහිපය තුළම නිසාකාරව සිදු වෙලා නැහැ.

***ප්‍රශ්නය ඃ තායිලන්තය වගේ රට වල ආණ්ඩු කෙසේද මේ සඳහා සහභාගි වන්නේ කොහොමද ස්වාමින්වහන්ස?***

පිළිතුර ඃ අපේ රටේ වාගේ බුද්ධ ශාසන අමාත්‍යාංශයක් තායිලන්තයේ නැති නමුත් රජය මගින් විශාල වශයෙන් සහයෝගය ලබා දෙන අමාත්‍යාංශයක් වගේම සංවිධාන එරට තිබෙනවා. ඒ හරහා අවශ්‍ය සියලු දේ සඳහා රජය විශාල ලෙස සහයෝගය ලබා දෙනවා. තායිලන්තයේ සිටින බෞද්ධයන් මේ සඳහා විශාල වශයෙන් උදවු උපකාර වෙනවා. නිදහසට පෙර ඉතිහාසය දෙස බැලු විට කෘෂි කර්මය මුල් කරගත්, බොහෝම හොඳ ශීලාචාර ගුණධර්ම වලින් පිරිපුන්, වැරදි වැඩ සඳහා ඉතාම සුළු පිරිසක් පෙළඹුන සමාජයක් අපේ රටේ තිබුණා. නමුත් නිදහසින් පසු, විශේෂයෙන් ම හැටේ දශකයෙන් පසු ඉතාම සීඝ්‍රව අප දියුණුව ලෙස හඳුන්වා දෙන පරිහාණිය ඇති වුණා. ඒ සඳහා අවශ්‍ය අනවශ්‍ය දේ හොඳින් තෝරා බේරාගෙන අවශ්‍ය දේ පමණක් ලබා දෙන්න කටයුතු කළා. විශේෂයෙන් ම මාධ්‍ය, ටෙලිවිෂන්, රේඩියෝ, වෙනත් තාක්ෂණ ක්‍රම නිසා සීඝ්‍ර පරිහාණියකට අපේ තරුණ, ළමා පිරිස් යොමු වෙලා. මැලේසියාවේ, සිංගප්පූරුවේ ජිවත් වු අයෙකු හැටියට මම දැකපු දෙයක්, ඒ රට වල නායකයන් මුලින් කළේ රටේ තරුණ පිරිස හදපු එක. විශේෂයෙන් ම පාසල් ළමුන්ට යහමග පෙන්වා දී ඔවුන් රටට, ජාතියට ප්‍රයෝජනවත් යහපත් පිරිසක් ලෙස ගොඩ නැගීම තමයි ඒ නායකයන් පළමුවෙන් කළේ.

අපේ දෙමාපියන් තම දරුවා බොහෝම ආදරයෙන් ඇති දැඩි කරනවා. අනතුරුව නියමිත වයසේ දී පාසල් පිටත් කරනවා. ඉන්පසු උසස් අධ්‍යාපනය සඳහා විශ්ව විද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන වෙත යොමු කරනවා. එතැනදී දෙමාපියන්ගේ ආරක්ෂාව, රැක්ම බැල්ම නැහැ. එසේ විශ්ව විද්‍යාලය වෙත ගිය විට කුමන් හෝ දේශපාලන පක්ෂයකට අයත් පිරිසක් පැමිණ මේ අහිංසක තරුණ ළමයාගේ මනසට විශාල විෂ බීජ ගොඩක් ඇතුල් කරනවා. ඉගෙනගෙන වැඩක් නැහැ. අපි සටන් කරන්න අවශ්‍යයි බලය අල්ලන්න අවශ්‍යයි කියා ආදි වශයෙන් දින ගණනාවක් නොයෙක් ආකාරයේ දේශන පවත්වා මේ තරුණ ළමුන්ගේ මනසට ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය ඇතුළත් කර නොමග යවනවා. මේ දෙය කරන්නේ තරුණ ළමුන්ට පමණක් නොවෙයි. අපේ පොඩි හාමුදුරුවරු ගත්තම උන්වහන්සේලාටත් කරන්නේ ඒ දෙයමයි. දෙමාපියන් දරුවෙකු පැවිදි කිරීම සඳහා

පන්සලට බාර දෙන්නේ බොහෝම සැදැහැසිතින්. නායක හාමුදුරුවන් මේ පොඩි ළමයා මහණ කරන්නේ ලොකු ආසාවකින්, ආදරයකින්. විශාල භක්තියකින් තමයි ගමේ දායකයෝ පොඩි හාමුදුරුවන්ට සිව් පසසෙන් උපස්ථාන කරන්නේ. ඉන්පසු මේ පොඩි හාමුදුරුවන් උසස් අධ්‍යාපනය සඳහා විශ්ව විද්‍යාලයකට හෝ භික්ෂු අධ්‍යාපන මධ්‍යස්ථානයකට ගිය විට නොමග ගිය සුළු පිරිසක් මේ පොඩි හාමුදුරුවන්ගේ මනසටත් යම් යම් දේ ඇතුල් කරනවා. මේ අවස්ථාව වෙද්දි මහණ වෙලා තියෙන්නේ ගත විතරයි. සිත තවම මහණ වෙලා නැහැ. ඒ නිසා මේ පොඩි හාමුදුරුවරුත් නොමග යනවා. මේක රටටත්, ශාසනයටත් මහා ඛේදවාචකයක්. මේ නිසයි රට පිරිහුනෙත්. ශාසනය පිරිහෙමින් තිබෙන්නෙත්.

*ප්‍රශ්නය : ස්වාමින්වහන්ස, මැලේසියාව, සිංගප්පුවරුව වගේ රටවල මේ වගේ ප්‍රශ්න මතු වුනේ නැද්ද?*

පිළිතුර : කවරදාවත් නැහැ. ඒ අයට දේශපාලනය විෂයයක් වශයෙන් හදාරන්න පුළුවන්. නමුත් ඒ අයට විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් වනතුරු පක්ෂ දේශපාලනය තහනම්. වර්ෂ 1984 දී ක්වාලාම්පූර් විශ්ව විද්‍යාලයේ බෞද්ධ සමිතියේ උපදේශක වරයෙකු වශයෙන් මම කටයුතු කළා. එහිදි එක්තරා දවසකට බෞද්ධ සමිතියේ චීන ජාතික සිසුන් පිරිසක් පන්සලට පැමිණියා. මම ඇසුවා ඇයි මේ අවේලාවේ? කියලා. එහිදි ඔවුන් කියා සිටියා 'විශ්ව විද්‍යාලය දින නියමයක් නැතිව වසා දැමූ නිසා අපට විශ්ව විද්‍යාලයෙන් පිටවන්න කියල. නමුත් එයට හේතු වූ කාරණය මේ ළමයි දන්නේ නැහැ. ඊට පසුදින තමයි අපි දැන ගත්තේ විශ්ව විද්‍යාලයේ නේවාසිකව සිටි සියලුම ළමයි හමුදාවේ වාහන වලින් පටවාගෙන ගොස් බස් නැවතුම් පොළට යවා විශ්ව විද්‍යාලය වසා දැමුවා කියා. එක්තරා මුස්ලිම් ළමුන් කණ්ඩායමක් දේශපාලනය පක්ෂයකට සම්බන්ධ රැස්වීමක් පන්ති කාමරයක පැවැත් වූ බව රජය දැන ගෙන විශ්ව විද්‍යාලය වසා දැමූ බව අපි පසුව දැනගත්තා. ඒ රටේ තියෙනවා අභ්‍යන්තර ආරක්ෂක සේවාව කියලා ආරක්ෂක අංශයක්. මේ ආරක්ෂක අංශය දේශපාලන රැස්වීමක් තිබු බව දැන ගෙන එය පාලකයන්ට දන්වා. අනතුරුව පාලකයන් ළමුන් ගෙවල් වලට පිටත්කර විශ්ව විද්‍යාලය වසා දැමුවා.

මාස දෙකකට පසුව නැවත ළමයින් අලුත් ඉල්ලුම් පත්‍රයක් සමග විශ්ව විද්‍යාලයට ඇතුල් කළා. ඇතුල් වෙනකොට මෙම ඉල්ලුම් පත්‍රය පුරවන්න අවශ්‍යයි. විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබනතුරු පක්ෂ දේශපාලනය විශ්ව විද්‍යාලය තුළ තහනම් යන එකඟතාවය එහි සඳහන්ව තිබුණා. ළමයින්ට තියෙන්නේ හොඳට ඉගෙන ගන්න. නිවාඩු වේලාවට පුස්තකාල, පරීක්ෂණාගාර වල ගත කර දැනීමෙන් පිරිපුන් දියුණු පුද්ගලයෙක් වී විශ්ව විද්‍යාලයෙන් එළියට එන්න. එළියට පැමිණි පසු ඕනෑම දේශපාලනයක යෙදුණාට කමක් නැහැ. මේ තත්ත්වය අපේ රටේ පාලකයන්ට තවමත් අවබෝධ කර ගන්න බැරි වෙලා. පක්ෂ දේශපාලනය අපේ පිරිවෙන් වලට, භික්ෂු අධ්‍යාපන ආයතන වලට, අනෙකුත්

සියලුම අධ්‍යාපන ආයතන වලට, විශ්ව විද්‍යාල වලට ගෙන ගොස් ළමයිට ඉගෙන ගන්න දෙන්නේ නැහැ. වර්ජනය කරන්නේ. විශාල කලකෝලහල කරන්නේ ඒ අය. එම කාලය පුස්තකාල තුළ ගත කරලා දැනීමෙන් වැඩි දියුණු වු පිරිපුන් පිරිසක් ලෙස එළියට පැමිණියේ නම් ඒ ළමයිගෙන් මේ රටට තියෙන ප්‍රයෝජනය කියා නිම කරන්න බැහැ. උපාධියක් අරගෙන එළියට ආවත් ඒ ළමයින්ගේ හිතේ තියෙන ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය නිසා ඔවුන්ගේ මුහුණේ හිනාවක් නැහැ. අනුන් කෙරෙහි හිතේ දයාවක්, අනුකම්පාවක් නැහැ. ඔවුන්ට ගන්න තියෙන එකම රැකියාව රජයේ රැකියාව, එය ගත්තත් නිර්මාණාත්මක හැකියාවක් නැහැ. සියල්ල කරන්නන් වාලේ කරනවා. එය තමයි අපේ රටේ පරිහාණියට මුලිකම හේතුව. ඒ නිසා ලෝකයේ කිසිම දියුණු රටක නැති මේ ක්‍රමය අපිත් අනුගමනය කරන්න ඕන රට හදන්න නම්.

*ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, අපේ මෑත ඉතිහාසය දෙස බැලූ විට අපි නොමග ගියේ ඇයි? කොහොමද?*

පිළිතුර : එසේ නොමග ගියේ අපේ ළමයි ටික හදා නොගැනීම නිසා. යම් යම් තරුණ පිරිස් වලට මේ පක්ෂ දේශපාලනය කවලා තියෙනවා. එක්දහස් නවසිය පනස් ගණන් වල සිට තිබුණේ වෛරය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය පදනම් කර ගත් දේශපාලනයක්. වෙන රටවලත් දේශපාලනය තියෙනවා. නමුත් එහිදි කරන්නේ ඡන්ද කාලයට ගිහිල්ල ඡන්ද දීම පමණයි. නමුත් අපේ එහෙම නෙවෙයි. මුළු ජිවිත කාලය පුරාම ගැටුම් තිබෙනවා. තවත් කෙනෙක් වෙනත් පක්ෂයක නම්, අනෙක් කෙනා වෙනත් පක්ෂයක නම් මේ අය මහා වෛරක්කාරයෝ කරලා. මේ වෛරය ඉතාම භයානකයි. ඒ වෛරයත් සමඟ ඒ අය කරන අධ්‍යාපනය, රැකියාව, දේශපාලනය ඕනෑම දෙයක් වෙන්න පුළුවන්, ඒ කිසිම දෙයක් කවදාවත් සාර්ථක වෙන්නේ නැහැ. ඒ නිසා මේ ගැන හිතලා, මේ පිළිබඳ කල්පනා කරලා දැන්වත් යන තත්ත්වය අවබෝධ කරගෙන ක්‍රියා කරන්න අවශ්‍යයි. තව අවුරුදු විස්සකින් මේ රට හදාන්න අවශ්‍ය නම් දැන්ම සිට නිසි ලෙස ක්‍රියා කරන්න අවශ්‍යයි. අධ්‍යාපන ක්ෂේත්‍ර තුළින්, සම්පූර්ණයෙන්ම අධ්‍යාපනය ලබන ආයතන තුළින් මේ පක්ෂ දේශපාලනය ඉවත් කරන්න අවශ්‍යයි. එහෙම කලොත් රටට වැඩදායි පිරිසක් ඇති වේවි. ඒ පිරිස රට දියුණු කරයි.

*ප්‍රශ්නය : රටක් හැටියට අපි ඒ ප්‍රතිසංස්කරණය කරන්නේ කොහොමද?*

පිළිතුර : ආණ්ඩුවක් තියෙන්නේ ඒකට තමයි. නිතීය අවශ්‍ය කරන්නේ එයට තමයි. ඒ නිතිය ක්‍රියාත්මක කරලා මැලේසියාවේ කළා වාගේ විශ්ව විද්‍යාලයට ඇතුලත් වෙන කොටම ඇතුලත් වන ශිෂ්‍යයන්ගෙන් පොරොන්දුවක් ගන්න පුළුවන්. මොන දෙමාපියන් ද, මොන පුරවැසියා ද එයට විරුද්ධ වෙන්නේ? අකමැති වෙන්නේ? ඔය ළමයි හොඳට ඉගෙන ගන්න. තමන්ටත් ප්‍රයෝජනවත්, රටටත් ප්‍රයෝජනවත්, තනියම ජිවත් වෙන්න

පුළුවන්, කිසිවෙකුගෙන් යැපෙන්නේ නැති, හොඳ පිරිපුන් මිනිසෙක් ලෙස එළියට එන්න. එළියට ඇවිල්ල අවශ්‍ය නම් ඕනෑම දේශපාලන පක්ෂයකට බැඳෙන්න. එය පාලකයන් තේරුම් ගෙන මේ විශ්ව විද්‍යාල හෝ උසස් අධ්‍යාපනය අවසන් වෙනතුරු නිති මාර්ගයෙන් හෝ දේශපාලනය කිරීම ඉවත් කළේ නැතිනම් කවරදාවත් මේ රට හදන්න බැහැ. අපි තේරුම් ගන්න අවශ්‍යයි ඒ පාලකයන් රටට, ජාතියට නෙවෙයි ආදරය තමන්ටම පමණක් කියලා. අනෙක් කාරණය තමයි මේ රටට ගැලපෙන අධ්‍යාපන ක්‍රමයක් සකස් කර, ඒ තුලින් රටට ආදරය කරන පිරිසක් ඇති කිරීම. එහිදි මේ රටේ භාෂාව, සංස්කෘතිය, ඉතිහාසය ආදී විෂයයන් පිළිබඳවත් සැලකිලිමත් වන්න අවශ්‍යයි. ධර්මය ඉගෙන ගන්නා තරමටයි බුදු දහමේ ඇති වටිනාකම තේරෙන්නේ. ඒ අනුව භික්ෂූන් වහන්සේලාට ගැලපෙන අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීමත් ඉතාමත්ම වැදගත්. හොඳ භික්ෂූන් වහන්සේලා පිරිසක් ඇති කිරීමෙන් පමණයි ශාසනය ආරක්ෂා වෙන්නේ. ගුණධර්ම, සාරධර්ම වලින් යුත් සමාජයක් ගොඩ නැගෙන්නේ ඒ අනුවයි.

***ප්‍රශ්නය : ඔබ වහන්සේ හිතන්නේ අපේ රටට පක්ෂ දේශපාලනය ගැලපෙන්නේ නැහැ කියලද? මේ ක්‍රමය ගැලපෙන්නේ නැද්ද? නැති නම් වෙනත් ක්‍රමයක් හඳුන්වා දිය යුතුද?***

පිළිතුර : වෙනත් රටවලත් පක්ෂ දේශපාලනය තියෙනවා. මැලේසියාව, අමෙරිකාව, එංගලන්තය යන සියලුම රටවල තියෙනවා. නමුත් මේ ලෙස කුලල් කා ගැනීමක්, වෛරයක්, ඊර්ෂ්‍යාවක් දකින්න ලැබෙන්නේ නැහැ. පසුගියදා එංගලන්තයේ පැවති මැතිවරණයේ දී මැතිවරණ දිනයට පෙර දිනයි බොහෝ අය තීරණය කළේ කාටද ඡන්දය ලබා දෙන්නේ කියලා. ඒ අය මධ්‍යස්ථයි. නමුත් අපේ රටේ අය මුළු ජීවිතය තුළම ඒ ලේබල් එක ගහගෙන ඉන්නවා. නිදහස් චින්තනයක් නැහැ. පක්ෂ වලට වහල් භාවයක් ඇති කරගෙන. ඒ පරිහානියට හේතුවක් බව අපේ රටේ ගිහි පැවිදි කොයි කවුරු වුණත් මෙය හොඳින් තේරුම් ගැනීම අවශ්‍යයි. සියලු ජාති, ආගම් වලට අයිති සියලු දෙනාම මෙය අවබෝධ කරගන්න අවශ්‍යයි.

***ප්‍රශ්නය : ඔබ වහන්සේ අදහස් කරන්නේ ඊළඟ පරම්පරාව මේ දේශපාලනයට එකතු වීම වෙනස් කළ යුතුයි කියලාද?***

පිළිතුර : ඊළඟ පරම්පරාව හදන්න නම් මුලින්ම විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. පක්ෂ දේශපාලනය තිබුණාට කමක් නැහැ. වෛරය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය පනදම් කර ගත් එකක් වෙන්න බැහැ. රූපවාහිනී නාලිකාවක්, ගුවන් විදුලි නාලිකාවක් බලන්න. ඒවායේ දේශපාලන පක්ෂ කිහිපයක් එකතු වූ විට සම්පූර්ණයෙන්ම කථා කරන්නේ පුංචි ළමයින්ට වුනත් වෛරය, ඊර්ෂ්‍යාව ඇති වන ආකාරයට. ඒ වගේ තත්ත්වයක් මේ සමාජය තුළ අපි ඇති කරන්නේ ඇයි? මහා උගත්තු කියන පිරිස, රටේ පාලකයෝ කියන පිරිස ඒ ආකාරයට කටයුතු කරන්නේ ඇයි ? ඒ අය නිතරම අපි මේ

කථා කරන්නේ මේ රටේ පුංචි දරුවාගේ සිට වැඩිමහල්ලා දක්වා වන සාමාන්‍ය මිනිස්සුන්ට කියන එක කල්පනා කරන්න අවශ්‍යයි. පසුගිය කාලයේ රජයක් බලයට පත් වු විට හැම මන්ත්‍රී කෙනෙකුටම සුරාසල් දෙකක් අලුතින් තමන්ගේ කොට්ඨාශයේ විවෘත කරන්න අවසර ලබා දුන්නා. මෙන්න අපේ නායකයෝ. ඒ අය බැලුවේ මෙයින් බදු අය කරලා, ආදායම් වැඩි කර ගන්න එක විතරයි. සමාජ පරිහානිය, මේ මිනිස්සු අසනීපව ආරෝග්‍ය ශාලාවට ගිය විට කරන වියදම්, ඒ මිනිස්සුන්ගේ පවුල් ජීවිත වල ඇති වන අවුල් වියවුල් ගැන කල්පනා කළේ නැහැ. දැන් ඒ සියල්ලක්ම සිද්ධ වෙලා. මේ සමාජයම අසරණයි.

***ප්‍රශ්නය : ඔබ වහන්සේ මත්ද්‍රව්‍ය පිළිබඳ සෑහෙන්න උනන්දු වෙනවා. දැන් අපේ තරුණ තරුණියන් සෑහෙන්න මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා තියෙනවා. එය දැන් රටේ විශාල ප්‍රශ්නයක්. ඒ සම්බන්ධව ඔබ වහන්සේට වැඩපිළිවෙලක් තියෙනවාද?***

පිළිතුර : මැලේසියාව, සිංගප්පුවරුව, තායිලන්තය වැනි රටවල් වල මත්ද්‍රව්‍ය සුළු ප්‍රමාණයක් හෝ ගෙනන කෙනෙකුට මරණ දඩුවම ලබා දෙනවා. බොහෝ විට මත්ද්‍රව්‍ය එන්නේ බුරුමයේ ''ගෝල්ඩන් ට්‍රැන්ගල්'' කියන ප්‍රදේශයෙන්. ඒ රටවල තද නීති ඇති කර ඒවා පාලනය කර තිබෙනවා. ජීවිතයට තිබෙන බයට මත්ද්‍රව්‍ය ගෙන්නේ නැහැ. අපේ රටේ නීතිය තිබෙනවා. නමුත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මම දන්න බුද්ධාගම අනුව නම් වැරදි වැඩක් කරන කෙනෙකුට දඩුවම් ලබා දෙන්න අවශ්‍යයි. හොඳින් කියලා බලනවා මේක නවත්වන්න පුළුවන්ද කියලා. දරුවෙක් නම් ඒ දරුවාට දෙමාපියන් හොඳින් කියලා බලනවා මේක නවත්වන්න පුළුවන්ද කියලා. බැරිනම් නොයෙක් ආකාරයෙන් දඩුවම් කරලා බලනවා. නොයෙක් විධියේ සම්මාක්ප්‍රයෝග වලින් ඒ දරුවා හදන්න බලනවා. ඒ දරුවා මුළු සමාජයටම පිළිලයක් නම්, මුළු සමාජයම විනාශ කරනවානම් රජයක් තියෙන්නේ ඒවා නවත්වන්න. නීති ක්‍රියාත්මක කරන්න. එක මිනිහෙක් ආරක්ෂා කරනවාද? අනූනවයක් දුක් විඳිනවාද? අනූනවය රැක ගන්නවාද? එක් මිනිහෙක් රැක ගන්නවාද කියන එක තීරණය කරන්න ඕනේ රජයයි. නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. නීතිය ක්‍රියාත්මක නොකිරීම නිසා, නීතියෙන් පැනලා යන්න පුළුවන් නිසා, පගාව දීලා නීතියෙන් බේරෙන්න පුළුවන් නිසා මේ සමාජයේ තුළ විශාල පිරිසක් වැරදි වැඩ කරන්න පෙළඹිලා.

අපි මේ සමාජය තුළ, මේ සමාජය හදන්න කියලා පොත් වලින්, දේශන වලින් තරුණ ළමයි මහන කරගෙන පැයට සැතපුම් දහයක පමණ ඉබිගමනින් ගියාට, පැයට සැතපුම් දහසක පමණ වේගයෙන් මාධ්‍ය මගින් සමාජය විනාශ කරනවා. ඒ නිසා මේ සෑම අංශයක් ගැනම පාලකයෝ කල්පනා කළ යුතුයි. මේ රටට, ජාතියට ආදරයක් තියෙනවා නම්, මේ රට දියුණු කරන්න අවශ්‍ය නම් මේ පිළිබඳ කල්පනා කරලා එකමුතුව, සමගියෙන් යම් වැඩපිළිවෙලක් සකස් කරන්න අවශ්‍යයි. එහෙම නැතිව රටක් හදන්න

බැහැ. රටක් හදන්න විශේෂයෙන්ම මෛත්‍රිය, කරුණාව, දයාව, අනුකම්පාව, සුහදත්වය වගේ දේවල් අපි තුළ වර්ධනය කරන්න අවශ්‍යයි. ජාති, ආගම්, කුල, නිකාය වශයෙන් බෙදිලා සිටින තුරු, බෙදිලා ඇනකොටා ගන්න තුරු, කුලල් කා ගන්න තුරු රටක් දියුණු කරන්න බැහැ. තමන්ගේ ආගම, ජාතිය, භාෂාව, සංස්කෘතිය ඒ අය කරගෙන ගියාදෙන්. හැබැයි අනුන්ට හිරිහැරයක් නොවන ආකාරයෙන්. පාලකයන්ගේ වගකීම අන් අයට කරදරයක් ඇති නොවන ආකාරයෙන් සෑම දෙනාටම ජීවත් විය හැකි සමාජයක් බිහි කිරීමයි. පාලකයන් කියලා පිරිසක් පත් කර ගන්නේ එයටයි.

***ප්‍රශ්නය : ක්‍රමයෙන් පාලකයන් ගැන සමාජය තුළ තිබෙන විශ්වාසය අඩු වෙන බවක් පෙනෙනවා නේද?***

පිළිතුර : ඇත්ත වශයෙන්ම පාලකයන් කියන අයගේ චේතනාව හොඳ වෙන්න අවශ්‍යයි. විශේෂයෙන්ම පාලකයා කියන කෙනා සමාජ සේවකයෙක්. වැටුපක් ලැබුණාට, යම් යම් පහසුකම් ලැබුණාට එයා සමාජයට සේවය කරන්න බැඳුණු පුද්ගලයෙක්. ඒ නිසා එයාගේ චේතනාව හොඳ වෙන්න අවශ්‍යයි. ඇයි මම මේකට යන්නේ? මොකක්ද මගේ බලාපොරොත්තුව. මුදල් උපයන්නද? තමන්ගේ නම්බුව ආරක්ෂා කරන්නද? ඕනෑම ජරා වැඩක් කරලා තමන්ගේ පරම්පරාව හදන්න නම් ඒවාගේ අය මේ සමාජයෙන් ඉවත් කරන්න අවශ්‍යයි. ඒ නිසා පාලකයෝ කියන අය තෝරා ගැනීමේ දී මහජනතාව ඉතා බුද්ධිමත්ව මේ තත්ත්වය තේරුම් ගන්න අවශ්‍යයි. පාලනයට හොඳ මිනිස්සු ටිකක් පත් කරගන්න අවශ්‍යයි. රටට, ජාතියට ආදරය ඇති, කරුණාව,මෛත්‍රිය, දයාව තියෙන, හොරකම්, ජඩකම්, මංකොල්ල කෑම් ආදියට සම්බන්ධ නැති යහපත් පිරිසත් තෝරලා එවන එක රටේ මහජනතාවගේ වගකීමක්.

***ප්‍රශ්නය : අද සමාජය තුළ බහුතරයක් ඔබවහන්සේ කියන දෙයට සියට සියයක් එකඟ වෙනවා. නමුත් සමාජයේ තුළ සුළුතරය තමයි බහුතරය නිහඬ කරන්නේ. මේ සුළු පිරිසක් නගන ඝෝෂාවට බහුතරය යටපත් වෙලා නේද?***

පිළිතුර : එයට ප්‍රධානම හේතුව තමයි අපේ ප්‍රධාන ජාතිය දෙකට බෙදී සිටීම. සිංහල ජාතිය දෙකට බෙදිලා. 1956 සිටම දෙකට බෙදිලා. සිංහල ජාතිය අතර කලින් සඳහන් කළ වෛරය, ඊර්ෂයාව. ක්‍රෝධය පදනම් කර ගත් විශාල කුලල් කා ගැනීමයක් තියෙනවා. කුමන දේශපාලන පක්ෂය බලයට පැමිණියත් එක කොටසකට මදි. ඒ නිසා එක්තරා සුළු පිරිසක් පසුපස ගිහින්, ඒ පිරිසගේ උදව් උපකාර ඇතිව තමයි රජයක් පිහිටුවන්නේ. ඊළඟට පත්වන රජයට තමන්ගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න බැහැ. එසේ සම්බන්ධ වූ සුළු පිරිස නිසා බලය රැකගෙන ඉන්න අවශ්‍ය නිසා තමන්ගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න බැහැ. බලයේ සිටින්න යම් යම් ක්‍රියා මාර්ග ගන්නවා මිසක්, රට හදන එකක් ගැන හිතන්න බැහැ.

*ප්‍රශ්නය : ස්වාමින් වහන්ස ගම් මට්ටමේ වුවත්, පාර්ලිමේන්තු මට්ටමේ වුවත් සමාජය තුළ මේ තත්ත්වය දැකිය හැකියි.*

පිළිතුර : එය සාමාන්‍ය දෙයක් බවට පත් වෙලා. අපි හිතාගෙන ඉන්නේ අපේ සමාජයේ සිටින වැඩි පිරිසක් නරක මිනිසුන් කියලා. නරක හාමුදුරුවරු කියලා. මම සොයාගත් තොරතුරු වලින් මට දැන ගන්න ලැබුණ ආකාරයට මේ සමාජයේ ඉන්නෙ සියයට අසූවක් ඉතාමත් හොඳ මිනිස්සු. හාමුදුරුවරුද එහෙමයි. සියයට දහක් පමණ අය පනහට, පනහ වැරදි වැඩ කරනවා. බිව්වත් තරමකට බොනවා. හොරකම් කලත් දරුණු ලෙස සොරකම් කරන්නේ නැහැ. පවුල්වල රණ්ඩු කරන්නේ නැහැ. තවත් ඉතාම නරක දරුණු වැඩ කරන සියයට දහක් සමාජය තුළ ඉන්නවා. ඒ දහය ළඟ නොයෙක් ආයුධ තියෙනවා. මුදල් තියෙනවා. කණ්ඩායම් වශයෙන් නරක වැඩ කරනවා. අර සියයට අනූවම ඒ අයට බයයි. පාර්ලිමේන්තුව තුළත්, අපේ අනෙකුත් පාලන තන්ත්‍ර තුළත්, සමාජය තුළත් සිදු වන්නේ එයයි. පාලකයන්ට යුතු කමක් තියෙනවා ඒ දහයට නීති මාර්ගයෙන් දඬුවම් දීලා, අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්න.

*ප්‍රශ්නය :අද සමාජයේ ඒ නිහඬව සිටින සියයට අනූවක පිරිස අවදි කරන්නේ කොහොමද?*

පිළිතුර : රටේ තිබෙන නීතිය හරියට ක්‍රියාත්මක වෙනවානම් ඒ අය අවදි වෙයි. පාලක පක්ෂය ඒ නීති ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. පාලකයන් හෝ ඒ වගකීම් දරණ අය වැරදි කළ විටත් දඬුවම් කරන්න අවශ්‍යයි. ඔවුන් ඒ දඬුවම් විඳින්නත් අවශ්‍යයි. ඒ වගේම රාජ්‍ය තන්ත්‍රයේ උසස් නිලධාරින් වැරදි වැඩ කරනවානම්, ඒ අය නීතියට යටත් වෙන්න අවශ්‍යයි. ඒ නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. විශේෂයෙන්ම ආරක්ෂක අංශ ඒ නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. එසේ ක්‍රියාත්මක කරන විට අර අයගේ බය නැති වෙනවා. දැන් තියෙන්නේ බයක්. සාධාරණ බයක්. අහිංසක බයක්. අපි කැමතිද නිකරුනේ තමන්ගේ ගේ ගිනි තියෙනවාට. තමන්ගේ ස්වාමි පුරුෂයාගේ හෝ දරුවාගේ අතක් පයක් කඩා දැම්මොත් මොකද වෙන්නේ. ඒ අයට තියෙන්නේ මේ වාගේ සාධාරණ, අහිංසක බයක්. ඒ බය නිසා ඉන්නවා. නීතිය යම් විධියකින් හරියට ක්‍රියාත්මක වෙනවාද, එදාට මහජනතාව එළියට එයි.

*ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, සමස්ථයක් වශයෙන් බැලුවොත් අපේ පාලකයන්ට එක උපදෙසක් දෙන්න තියෙනවානම් ඒ උපදෙස කුමක්ද?*

පිළිතුර : මට දෙන්න පුළුවන් ලොකුම උපදේශය තමයි මේ කථා කරන සියලුම පක්ෂ, ජාති, ආගම් වලට අයිති සියලු දෙනාටම අවශ්‍ය කරන්නේ මේ රට හදන්න. මේ රට

සෞභාග්‍යයෙන් පිරි, බුද්ධාගම අනුව නම් කන්න බොන්න, අඳින්න පළඳින්න, ගෙවල් දොරවල්, බෙහෙත් හේත් ආදි වශයෙන් වන සිව්පසයෙන් පිරි රටක් කරන්න. පහසුවෙන් යන්න එන්න පුළුවන් අමෙරිකාවේ, එංගලන්තයේ, ජපානයේ තියෙනවා වාගේ පාරවල්, ගොඩනැගිලි තියෙන ආකාරයේ තත්ත්වට ගේන්න. ඔය හැමෝටම අවශ්‍ය කරන්නේ මේ රට හදන්න නම්, මේ අයට එකට එකතු වෙලා වැඩ පිළිවෙලක් කරන්න බැරි ඇයි? මේ අයට එකතු වෙලා ඒ ඒ අමාත්‍යාංශ වල යම් කිසි ස්ථිර ප්‍රතිපත්ති මාලාවක් සකස් කරන්න බැරි ඇයි? අවබෝධයකින් වැඩ කිරීම තමයි කළ යුතුව තියෙන්නේ. එහෙම කළොත් අපේ රට, මේ ධර්ම ද්විපය එදා බොහොම සශ්‍රීකව තිබූ, ගුණධර්ම වලින් ඉතා ඉහළ මට්ටමක තිබූ මේ ධර්මද්විපය නැවත වාරයක් හොඳ ධර්ම ද්විපයක් බවට පත් වෙයි. එහෙම නැත්නම් තව දුරටත් පරිහාණියට පත් වෙයි.

***බොහෝම ස්තුතියි ස්වාමින්වහන්ස.***